## 2024-12-30 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **2025 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2025 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස 2024-11-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති 2025 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

02. **මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය (Headline Inflation) අපගමනය වීම පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(1) වගන්තිය යටතේ මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක මට්ටමක පවත්වාගෙන යාමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. එකී ගිවිසුමේ 26(5) වගන්තියට අනුව, එම උද්ධමන ඉලක්ක නිශ්චිත ආන්තිකයෙන් අනුක්‍රමික කාර්තු දෙකක් තුළ දී සපුරා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපොහොසත් වුවහොත්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ඒ පිළිබඳ වාර්තාවක් මුදල් විෂයභාර අමාත්‍යවරයා මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු වේ. 2024 වසරේ දෙවන හා තුන්වන කාර්තුවලදී කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය පිළිවෙලින් 1.4%ක් සහ 0.8%ක් ලෙස වාර්තා වී ඇති අතර, එය එකී උද්ධමන ඉලක්කයේ පහළ ආන්තිකයට වඩා අඩු වීමක් ලෙස පෙන්නුම් කරයි. එම කරුණු ඇතුළත්ව, මහ බැංකු පනතේ විධිවිධාන යටතේ මුදල් විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති මතුපිට උද්ධමනය අපගමනය පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත

කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

03. **රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කඩිනම් ක්‍රමෝපායික තීරණ ගැනීම සඳහා නිලධාරි කමිටුවක් පත් කිරීම**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 44(3) වගන්තියට අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධරයන් සහ ගණන්දීමේ නිලධරයන් විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කඩිනම් ක්‍රමෝපායික තීරණ ගැනීම, සැලසුම් කිරීම, සම්පත් විභජනය කිරීම, අයවැයකරණය, මූල්‍යකරණය සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු අස්ථිත්ව ප්‍රධානීන් එකොළොස්දෙනෙකුට (11) නොවැඩි සාමාජිකයින්ගෙන් සමන්විත වන කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු වේ. පසුගිය දශකය තුළ රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනයෙන් අපේක්ෂිත ප්‍රතිඵල හා දරනු ලැබ ඇති පිරිවැයට සරිලන ප්‍රතිලාභ නොලැබීම මත ඉලක්කගත සංවර්ධනයක් කරා ගමන් කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වී තිබේ. එබැවින්, සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බලපානු ලබන විවිධ ගැටලු මඟහරවා ගැනීමටත්, ව්‍යාපෘති කළමනාකරණයට හා අධීක්ෂණයට අදාළව ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කිරීමටත් හැකිවනු පිණිස ජනාධිපති ලේකම් විසින් පත් කරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් දෙදෙනකු හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකු ඇතුළු සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත "රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම කමිටුව" ස්ථාපිත කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

04. **ශ්‍රී ලංකාවේ පළමු ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට ඉදිරිපත් කිරීම**

1993 වර්ෂයේ සිට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ සහ 2016 වර්ෂයේ සිට පැරිස් ගිවිසුමේ පාර්ශ්වකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව කටයුතු කරනු ලබයි. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය සහ පැරිස් ගිවිසුම මඟින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. පැරිස් ගිවිසුමේ 13වන වගන්තිය යටතේ සෑම පාර්ශ්වකරුවෙකු විසින්ම 2024-12-31

දිනට පෙර එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියට අදාළව පළමු ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කළ යුතුවේ. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ, දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ සහ පැරිස් ගිවිසුමේ මගපෙන්වීම්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ පළමු ද්විවාර්ෂික විනිවිදභාව පිළිබඳ වාර්තාව සකස් කර තිබේ. ඒ අනුව, එකී වාර්තාව එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියට ඉදිරිපත් කිරීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **වී මිල දී ගැනීම සඳහා මීට පෙර ක්‍රියාත්මක කරන ලද ඔඩපණ ණය යෝජනා ක්‍රමය 2024/25 මහ කන්නයේ සිට වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම**

වී අස්වනු සඳහා සාධාරණ මිලක් සහතික කිරීමේ හා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් ශක්තිමත් කිරීමේ අරමුණින් සහනදායී පොලී අනුපාතයක් යටතේ රාජ්‍ය බැංකු හරහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා 2023-08-14 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. පසුගිය කන්නවලදී මෙම වැඩසටහන ඉහළ ප්‍රගතියක් අත් කර ගෙන ඇති බව නිරීක්ෂණය වී ඇති බැවින්, 2024/25 මහ කන්නයේ සිට සෑම කන්නයකදීම එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, නිශ්චිත නිර්ණායක කිහිපයකට යටත්ව, උපරිම දෛනික වී කෙටීමේ ධාරිතාව මෙට්‍රික්ටොන් 25ක් දක්වා වන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් (වී මෝල් පවත්වාගෙන යනු ලබන සමූපකාර සමිති ද ඇතුළුව) වෙත රාජ්‍ය හා පෞද්ගලික බැංකු හරහා සහනදායී පොලී අනුපාතයක් යටතේ රුපියල් මිලියන 50ක උපරිමයක් දක්වා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත්වීමේ/සංක්‍රමණ ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ වෙළෙඳ සන්නාමවලට අයත් කාන්තා සහ පිරිමි දෙපාර්ශ්වයේම ඇඟළුම් සහිත අලෙවිසැල් ක්‍රියාත්මක කිරීම**

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි මගී පර්යන්ත ගොඩනැගිල්ලේ පිටත්වීමේ/සංක්‍රමණ ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ වෙළෙඳ සන්නාමවලට අයත් කාන්තා හා පිරිමි යන දෙපාර්ශ්වයේම ඇඟළුම් සහිත අලෙවිසැල් 04ක් වසර 03ක කාලසීමාවකට පවත්වාගෙන යාම සඳහා මෙහෙයුම්කරුවන් තෝරාගැනීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසුකරුවන් 03 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අලෙවිසැල් දෙකක් පවත්වාගෙන යාම සඳහා වන මෙහෙයුම්කරුවන් වශයෙන් පිළිවෙලින් M/s Odel PLC සහ M/s Insomnia (Pvt) Ltd තෝරා ගැනීමටත්, අනෙකුත් අලෙවිසැල් සඳහා නැවත ලංසු කැඳවීමටත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **මෙරපනම් එන්නත් ග්‍රෑම් 1න් වයල් 900,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

උග්‍ර බැක්ටීරියා ආසාදන සඳහා ප්‍රතිකාර කිරීමට භාවිත කරනු ලබන මෙරපනම් එන්නත් ග්‍රෑම් 1න් වයල් 900,000ක් සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 05ක් ලැබී තිබූ අතර, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වශයෙන් පාකිස්ථානයේ M/s Genix Pharma (Pvt) Ltd. වෙත එකී ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ තිබේ. ඒ අනුව, මෙරපනම් එන්නත් ග්‍රෑම් 1න් වයල් 900,000ක් සපයා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය එකී සමාගම වෙත පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ටෙනෙක්ටිප්ලේස් එන්නත් මිලිග්‍රෑම් 40න් වයල් 9,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

හෘදයාබාධ ඇති වූ පුද්ගලයින් මරණයට පත්වීම වළක්වා ගැනීම පිණිස භාවිත කරනු ලබන ටෙනෙක්ටිප්ලේස් එන්නත් මිලිග්‍රෑම් 40න් වයල් 9,000ක් මිල දී ගැනීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 03ක් ඉදිරිපත් වී තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන M/s ABC Pharma Services (Pvt) Ltd. වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා දෙමහල් වානේ ව්‍යූහ ගබඩාවක් ඉදිකිරීම**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා දෙමහල් වානේ ව්‍යූහ ගබඩාවක් රත්මලානේ ඉදිකිරීම පිණිස ජාතික තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 10ක් ලැබී තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s Dockyard General Engineering Services (Pvt) Ltd වෙත අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ නියෝග**

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම සඳහා 2022-01-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන අන්තර්ගත කරමින් 2022 අංක 8 දරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත නීතිගත කර තිබේ. ඒ අනුව, භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා වන නියෝග 2024-10-22 දිනැති අංක 2407/04 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග

අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥාපනත සංශෝධනය කිරීම

රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥාපනත අනුව, රාජ්‍ය නිලධාරීන් සඳහා ඇපකරයක් නියම කිරීම මඟින් එකී රාජ්‍ය නිලධාරියා ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී තමා අතින් රජයට සිදු විය හැකි පාඩු ඔහු විසින් තබන ලද ඇපකරයෙන් අය කර ගැනීම සිදු කරනු ලබයි. එම ක්‍රියාවලිය සරල හා කාලෝචිත අයුරින් සිදු කිරීමට හැකි වන පරිදි රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥාපනත පූර්ණ ප්‍රතිශෝධනයකට ලක් කිරීමට අවශ්‍ය සංශෝධන හඳුනාගැනීම සඳහා නිලධාරි කමිටුවක් පත් කිරීමට 2023-11-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, එකී නිලධාරි කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාව මත පදනම්ව රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥාපනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. 2024 අංක 36 දරන විදුලිබල පනත යළි සලකා බැලීම

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන 2024-06-27 දින සිට බලාත්මක වී ඇත. එකී පනතේ විධිවිධාන, යෝජිත ආයතන හා ඒවායේ කාර්යභාරයන් සහ වගකීම් එකී පනතින් අපේක්ෂිත අරමුණු සපුරා ගැනීමේලා අපොහොසත් වනු ඇති බවත්, එබැවින් සුරක්ෂිත සහ පිවිතුරු විදුලිබල ක්ෂේත්‍රයක් ඇති කිරීමේදී විදුලිබල කර්මාන්තයට හා පාරිභෝගිකයින් මත අමතර බරක් පැටවෙන බවත්, විවිධ පාර්ශ්ව විසින් පෙන්වා දී තිබේ. එබැවින්, තිරසර සහ සුරක්ෂිත විදුලිබල ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා උනන්දුවක් දක්වන අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින්, විදුලිබල පනතේ පරමාර්ථ යළි සලකා බැලීම අත්‍යවශ්‍ය වී ඇත. ඒ අනුව, 2024 අංක 36 දරන විදුලිබල පනත අධ්‍යයනය කර යෝග්‍ය සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ප්‍රධාන පාර්ශ්වකරුවන්, විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සඳහා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය**

කොමිෂන් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල මෙන්ම පළාත් සභාවල කාර්යමණ්ඩල නැවත සමාලෝචනය කර අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීමටත්, සේවා අවශ්‍යතා අනුව කාර්යමණ්ඩල නැවත ස්ථානගත කොට උපරිම සේවාවක් ලබා ගැනීමටත් අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **රජයේ මුද්‍රණාලයාධිපති තනතුරට පත් කිරීම**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ රජයේ මුද්‍රණාලයාධිපති වශයෙන් සේවය කරනු ලැබූ ජී.කේ.ඩී.ලියනගේ මහත්මියගේ සේවා කාලය 2024-12-24 දින අවසන් වීම මත පුරප්පාඩුව පවතින එකී තනතුරට සුදුසු නිලධාරියෙකු පත් කළ යුතුව ඇත. දැනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි කේ.ජී.පී. පුෂ්ප කුමාර මහතා එම තනතුරට පත් කිරීම සඳහා සුදුසු බවට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ඒ මහතා රජයේ මුද්‍රණාලයාධිපති තනතුරට පත් කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත බලාත්මක වීමෙන් පසු එම පනතට අනුව විමර්ශන, නඩු පැවරීම, පරිපාලනමය සහ අධිකරණමය කටයුතු සිදු කිරීමට යාමේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සැලකිය යුතු නෛතික අර්ථනිරූපණ හා තාක්ෂණික ගැටලුවලට මුහුණපෑමට සිදු වී ඇත. එබැවින්, ඉහත සඳහන් පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීමට සහ අලුතින් වගන්ති කිහිපයක් එකී පනතට හඳුන්වාදීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් යෝජනා කර තිබේ. ඒ අනුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන අධ්‍යයන කර අත්‍යවශ්‍යයෙන්ම සංශෝධනය කළ යුතු වගන්ති හා ඇතුළත් කළ යුතු නව වගන්ති පිළිබඳව නිර්දේශ සහිත

සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව යන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විතව කමිටුවක් පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **රාජ්‍ය ආයතන මහජනතාවට වගවීම තහවුරු කිරීම පිණිස අමාත්‍යාංශවල විමර්ශන ඒකක පිහිටුවීම**

මේ වනවිට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් දෛනිකව විශාල පැමිණිලි සංඛ්‍යාවක් නාමිකව සහ නිර්නාමිකව ජනාධිපති කාර්යාලයට, අග්‍රාමාත්‍ය කාර්යාලයට මෙන්ම, මහජන නියෝජිතයින් වෙත ද ලැබෙමින් පවතී. රජය කෙරෙහි පළ කළ මහජන විශ්වාසය ආරක්ෂා කර ගැනීමට මෙන්ම, විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ අපේක්ෂිත ධනාත්මක වෙනස්කම් සිදු කිරීම සඳහා එවැනි පැමිණිලි පිළිබඳව අපක්ෂපාතී මෙන්ම විද්‍යාත්මක කරුණු විමර්ශනයක් සිදු කළ යුතුව ඇත. ඒ අනුව, පැවති රජයන් යටතේ රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වී ඇති ආකාරය මෙන්ම, වත්මන් රාජ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් වන මහජන පැමිණිලි, කරුණු දැක්වීම් මෙන්ම විවිධ මූලාශ්‍රවලින් වාර්තා වන තොරතුරු සම්බන්ධයෙන් කරුණු විමර්ශනයට අමාත්‍යාංශ මට්ටමින් දීප ව්‍යාප්ත සේවාවක පළමු ශ්‍රේණියේ නිලධාරියෙකුගේ හෝ විමර්ශන ක්‍රියාවලිය සම්බන්ධ අත්දැකීම් සහිත රාජ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ විධායක නිලධාරියෙකුගේ හෝ ප්‍රධානත්වයෙන් විමර්ශන ඒකක පිහිටුවීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********